# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
புத்த சாசனம், சமய மற்றும் கலாச்சார அலுவல்கள், தேசிய ஒருமைப்பாடு,சமூக பாதுகாப்பு மற்றும் ஊடகத்துறை அமைச்சு
Ministry of Buddhasasana, Religious and Cultural Affairs , National Integration , Social Security and Mass Media


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல | DSD/Ho/05/MF/08/01/චක්‍ර ලේඛණ | |
| ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................................ | |
| දිනය<br>திகதி<br>Date | 2024.10.28 | |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ- 2024/10 ට දෙවන එකතුව**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමණාකරුවන්**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා විශේෂ මාසික දීමනාව හා දින වැටුප් ලබා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම</u>**

**<u>සුදුසුකම් සම්පූර්ණ නොකරන බැංකු/බැංකු සමිති සඳහා මාසිකව 50% දීමනාවක් අනුමත කිරීම</u>**

**01.** සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා විශේෂ මාසික දීමනාව ලබාගැනීමට අදාලව උපදෙස් ලබාදීම සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2024/10 හා ඊට නිකුත් කරන ලද පළමු එකතුව මගින් ලබාදෙන ලදී.
මාසික දීමනාව ලබාගැනිමට සියළුම බැංකු හා බැංකු සමිති වල නිළධාරීන්ට හා ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ටද හැකිවන පරිදි සහන සැලසීමට නිළධාරීන් විසින් කරන ලද ඉල්ලීම් වලට අනුව දීමනා චක්‍රලේඛය පහත පරිදි සංශෝධන කරන බව දන්වමි.

**02.** මාසික දීමනාව ලබාගැනිමට සම්පූර්ණ කළයුතු කොන්දේසි/නිර්ණායක මාසිකව සම්පූර්ණ කිරීමට නොහැකිවන සමෘද්ධි බැංකු ,බැංකු සමිති සඳහා අනුමත මාසික දීමනාවෙන් 50% ක් ලබාගැනීමට විශේෂ අනුමැතියක් හිමිවේ.
තවද, 2020 වර්ෂයෙන් පසුව පිහිටුවා ඇති ,නමුත් සුදුසුකම් සම්පූර්ණ නොවන සමෘද්ධි,බැංකු/ සමිති සඳහා ද දීමනාවෙන් 50% පමනක් හිමිවේ
.

**03.** සමෘද්ධි බැංකු සමිති වල සේවය කරන ව්‍යාපෘති කළමනාකරු, ව්‍යාපෘති සහකාර,සමාජ සංවර්ධන නිළධාරින් මෙන්ම කලාප සහකාර(ක්ෂේත්‍ර) , ග්‍රාම නිළධාරි වසම් වලට අනුයුක්ත සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ට ද මාසික දීමනාව ලබාගැනිම දි සම්පූර්ණ කලයුතු කොන්දේසි/නිර්ණායක සම්පූර්ණ නොවන විටක ද අනුමත මාසික දීමනාවෙන් 50% ක් මාසිකව ලබාදිය යුතුය.

**04.** ඉහත සහනය 2025.04.30 දින දක්වා වලංගු වන අතර, සුදුසුකම් සම්පූර්ණ නොවීම හේතුවෙන් පසුගිය මාස වල දී (2024 ජුලි මාසය තෙක්) දීමනාව ලබානොදුන් නිළධාරීන්ටද පසුගිය කාලයට හිමි දීමනාව ලබාදිය යුතුය.නමුත්,මෙම සහන කාලය සංශෝධනය කිරිමට අවස්ථාවක් ඇතිවුහොත් එසේ කිරිමට සිදුවන බවටත් දන්වමි.

**05.** දැනට නිකුත් කර ඇති චක්‍රලේඛ වල සඳහන් පරිදි, කොන්දේසි/නිර්ණායක සියල්ලම (100%) මාසිකව සම්පූර්ණ කරන බැංකු/බැංකු සමිති වල නිළධාරීන්ට අනුමත මුළු මාසික දීමනාව ලබාගැනිමට හිමිකම ඇත.
නමුත්,යම් එක් මාසයක කොන්දේසි/නිර්ණායක සම්පූර්ණ නොවු විටක, එම මාසයට/මාසවලට පමනක් දීමනාවෙන් 50% ලබාගැනිමට ද අවස්ථාව දෙනු ලැබේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**06.** තැන්පතු ඉලක්ක ගනනය කිරිමේ දී,දිරියමාතා,සමාජික කොටස්,ධනශක්ති,කණ්ඩායම්(සමුහ),කැකුළු හා සිසුරැක තැන්පතු හී සක්‍රිය හා අක්‍රීය තැන්පතු ශේෂ එකතු කර වර්ධනය ගනනය කල යුතුය. (අක්‍රිය ගිණුම් ශේෂ අඩු නොකර)

**07.** මාසික විශේෂ දීමනාව ලබාගැනීමට දී ඇති උපදෙස් අනුව අදාල නිළධාරීන්ට දීමනාව ලබාදීමට බැංකු/බැංකු සමිති කළමනාකරු ඇතුළු කාර්යය මංඩලය බැදී සිටියි.එසේ නොගෙවන අවස්ථා ඇත්නම්,ක්ෂුද්‍ර මුල්‍යය අංශයට දැනුම්දෙන ලෙස කාර්යය මංඩලයට දැනුම් දෙමි.

**08.** සංශෝධන මෙපමනක් වන අතර, අනිකුත් උපදෙස් සඳහා අංක 2024/10 හා ඊට පළමු එකතුවේ සදහන් උපදෙස් වලංගු කර ගන්නා මෙන් දන්වමි.

සී.ඩී කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

01 ලේකම්- බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු , ජාතික ඒකාබද්ධතා , සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
02 දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- කා.දැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
04 දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
05. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
06. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
07 සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ගැ.ස.